
10 ශ්‍රේණිය | 17 පාඩම | බුද්ධ ධර්මය

# නීරෝගී බව උතුම් ලාභයයි




අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික අධ්‍යාපන ආයතනය

# නීරෝගී බව උතුම් ලාභයයි

බුදු දහම අනුව රෝග දෙයාකාර ය

1. කායික රෝග
2. චෛතසික රෝග.

# නීරෝගී බව උතුම් ලාභයයි

ගිරිමානන්ද ස්වාමීන් වහන්සේට බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි මේ සිරුරෙහි විවිධ ආබාධ හට ගනී.

- ඇස් රෝග, ශ්‍රවණ රෝග, නාසා රෝග, දිවෙහි රෝග,
- සිරුරෙහි, හිසෙහි, කනෙහි, මුඛයෙහි හට ගන්නා රෝග,
- දත් රෝග, ක්ෂය රෝගය, ඇදුම,
- පීනස, දැවිල්ල, උණ, කුසෙහි රෝග, සිහි මූර්ඡා වීම,
- ලේ අතීසාරය, කොළරාව, කුෂ්ට, ගඩු,
- හමේ රෝග, ශ්වසන රෝග, අපස්මාර, දද, කඩුවේගන්,
- ගෙඩි, කැසීම, පණුහොරි, රත් පිත්,
- දියවැඩියාව, අංශභාග, පිළිකා, භගන්දලා ආදී වශයෙනි.

# නීරෝගී බව උතුම් ලාභයයි

බුදුරාජාණන් වහන්සේ විසින් ගිරිමානන්ද ස්වාමීන් වහන්සේට එහි දී රෝග වැළඳීමට හේතු වන කරුණු අටක් ද පෙන්වා දී තිබේ.

1. ශරීරගත පිත් ධාතුව කිපීමෙන් වැළඳෙන රෝග
2. සෙම් ධාතුව කිපීමෙන් වැළඳෙන රෝග
3. වාතය කිපීමෙන් වැළඳෙන රෝග
4. වා, පිත්, සෙම් යන තුන් දොස් කිපීමෙන් හට ගන්නා රෝග
5. සෘතු විපර්යාස නිසා වැළඳෙන රෝග
6. වැරැදි කායික ක්‍රියාකාරකම්වලින් හට ගන්නා රෝග
7. අනුන්ගේ උපක්‍රම නිසා හට ගන්නා රෝග
8. කර්ම විපාක අනුව හට ගන්නා රෝග

# නීරෝගී බව උතුම් ලාභයයි

- මිනිසුන්ට වැළඳෙන මානසික රෝග ගැන බුදු දහමේ ඇති අවධානය ඉතා විශාල ය.
- සමස්තයක් වශයෙන් රාග, ද්වේශ, මෝහ, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, මද, මාන ආදි සියලු කෙලෙස් මානසික රෝග ලෙස හැඳින්විය හැකි ය.

# නීරෝගී බව උතුම් ලාභයයි

- බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ. "**මම සම්බුද්ධ වෙමි. ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා ද වෙමි.**" උන් වහන්සේ විසින් වෙදකම් කරන ලද්දේ මිනිස් සිත් තුළ ඇණී ඇති රාගාදි උල් ඇද දැමීමට ය.

- වෛද්‍යවරු පිතෙන් හට ගන්නා ආබාධ, සෙමෙන් හට ගන්නා ආබාධ හා වාතයෙන් හට ගන්නා ආබාධ සමනය කිරීමට ප්‍රතිකාර කරති.

- බුදුරජාණන් වහන්සේ රාගයෙන් ද ද්වේශයෙන් ද මෝහයෙන් ද හට ගන්නා රෝගවලට ප්‍රිතිකාර කරති. ඒ, කෙලෙස් මුලින් උපුටා දැමීමට ය. එමගින් සසර සියලු දුක් සමනය වේ.

# නීරෝගී බව උතුම් ලාභයයි

- බුදුරජාණන් වහන්සේ වෛද්‍යවරයකු බව පෙළ දහමේ ම සඳහන් වේ. ‘සත්හට වන බව දුකට වෙදාණන්’ යනු ලෝවැඩ සඟරාවේ එන කවි පදයකි. ඉන් කියැවෙන්නේ සසර දුකට ප්‍රතිකාර කරන උතුම් වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේ බව ය.

# නීරෝගී බව උතුම් ලාභයයි

- භික්ෂූන්ගේ කායික රෝගවලට නියම කළ බෙහෙත් ගැන ද විනය පිටකයෙහි සඳහන් වේ.

- පෞද්ගලික පවිත්‍රතාව ඇසුරින් ද කායික නීරෝගී බව උදාකර ගත හැකි යැයි බුදු දහම පෙන්වා දෙයි තම ශ්‍රාවකයන්ට පිරිසිදු ව සිටීමට, නිතර ස්නානය කිරීමට, සිවුරු අඳන, පොරෝනාදිය පිරිසිදු ව තබා ගැනීමට අනුදැන වදාළ තැන් රැසක් විනය ග්‍රන්ථවල දැක්වේ.

- ගිලන්පස යනු සිව් පසයෙන් එකකි. අවේලාවෙහි ආහාර නොගන්නා භික්ෂූන් ගිලන්වීම වළක්වාලීමට කැපසරුප් පාන වර්ග වැළඳිය හැකි ය. ඒවා ගිලන්පස නම් වේ.

# නීරෝගී බව උතුම් ලාභයයි

- ආහාර අනුභව කළ යුත්තේ කුසට ඔරොත්තු දෙන තරමට ය. කුස පිරෙන්නට ම නොවේ. බත් පිඬු 4ක් 5ක් වැළඳීමට ඉතිරි ව තිබිය දී ජලය පානය කරන්න යැයි අවවාද කර තිබේ.

- කොසොල් රජුට ද වදාළේ පමණ දැන ආහාර ගන්නා ලෙස ය. කැඳ පානයෙහි ආනිසංස වෙනම ම දක්වා තිබේ.

# නීරෝගී බව උතුම් ලාභයයි

- නීරෝගී භාවය ඇති වන පරිදි පරිසරය පවත්වාගෙන යෑම ගැන බුදුරජාණන් වහන්සේ දක්වා ඇති උනන්දුව ඉතා විශාල ය.
- කැළිකසළ බැහැර කිරීම, කෙළ ගැසීම, මල මූත්‍රා කිරීම ආදි ක්‍රියාකාරකම්වල දී පරිසරයට සිදු වන හානිය වැළැක්වීමට ඇතැම් ශික්ෂා පද පනවා තිබේ.
- ආගන්තුක වත, ආවාසික වත, ගමික වත, භත්තග්ග වත, වැසිකිළි වත ආදි වශයෙන් දක්වෙන භික්ෂූන් වහන්සේලාට අදාළ වත් මුළුමනින් ම පාහේ පරිසර සංරක්ෂණයට උපකාරී වේ.

# නීරෝගී බව උතුම් ලාභයයි

ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං
විස්සාස පරමා ඤාති - නිබ්බාණං පරමං සුඛං

(ධම්ම පදය . සුඛ වග්ග)

ලාභයන් අතරින් නීරෝගි බව උතුම් ය. ධන සම්පත් අතරින් සතුට ශ්‍රේෂ්ඨ ය. ඥාතීන් අතරින් විශ්වාසවන්තයා උතුම් ය. ලෝකයේ හැම සැපතට ම වඩා නිවන් සැපය උතුම් වේ.